# ජුපිටර්හි අධිරාජයා හා නෝම් චොම්ස්කි

චින්තා සුභාෂිණී රණසිංහ

In the latter half of the 20th century Norm Chomsky revolutionised linguistic thought. The publication of his book 'Syntactic Structures' in 1957 ushered in a new era in the field of linguistics. Norm Chomsky stressed the connection between language and mind. The main assumption of his approch is 'Grammar is in the mind'. Humans are able to acquire the grammar of their language at an early age of the life. According to Chiomsky humans produce novel utterences all the time, and any body who does not is likely to be brain damaged. He believed that a person who acquires a anguage is not just learning a body of randon utterences but a set of rules or underlying principles for forming sentences patterns. This concept of the langunge is described in this imagenary story.

## හැඳින්වීම

මානව භාෂාවේ ස්වභාවය හා ඒ සඳහා ක්‍රියාත්මක වන 'ව්‍යාකරණ' විශ්ලේෂණය කර දැක්වීම සඳහා ජීන් අයිච්සන් (Jean) කථාකරන ක්ෂීරපායි සත්වයා (The Articulate mammal) ග්‍රන්ථයෙහි අටවන (8) පරිච්ඡේදයේ දී විස්තර කරන මනඃකල්පිත කථාවක සංක්ෂිප්ත පරිවර්තනයක් මෙම ලිපියෙන් ඉදිරිපත් කෙරේ.

යම් කිසි භාෂාවක සියලු වාගාලාප මතක තබා ගැනීම හෝ කට පාඩම් කිරීම සාපේක්ෂව අසීරු කාර්යයකි. වාගාලාප අසීමිත වීම, වාක්‍යයක ප්‍රමාණිකත්වය පිළිබඳ වාග්විද්‍යාත්මක සීමාවක් නොමැති වීම, පූර්ව සුදානමකින් තොර නව වාග් සංයෝජන නිපදවීමේ අවශ්‍යතාව යනාදී සාධක මිනිස් මොළයේ සවිඥානක 'මතක' ධාරිතාව අභිභවා යයි. දෙවන භාෂාවක් ඉගනීමේදී අප මුහුණ පාන දුෂ්කරතාවන්ට හේතු වන්නේ ද මෙයයි.